**වාවාකච්චේරි නගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2016 මාර්තු 24 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 17 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 28 දින සභාවේ කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් වාවකච්චේරි නගර සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ දෝෂ**
**------------------**

පහත සඳහන් ගණකාධිකරණ දෝෂ නිරීක්ෂණය වේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ උසාවි දඩ මුදල් ගිණුම්වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගිණුම්වල ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විදුලිය පිළිබඳ සියලුම මෙහෙයුම් 2009 වර්ෂයේ පමණ ලංකා විදුලිබල මණ්ඩලයට පවරා දී තිබු නමුත්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.241,156 ක් වූ විදුලි ගබඩා තොග ශේෂය කපාහැරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව පත්කර නොමැති ශේෂ වශයෙන් එය ගිණුම්වල දක්වා තිබුණි.

**1.3.2 ලැබිය යුත මුදල්**
**-----------------**

රු.107,984 ක් වූ අයවිය යුතු කාර්ය මණ්ඩල ණය ශේෂ අයකර ගැනීම සඳහා සභාව විසින් වසර හයකට වැඩි කාලයක් තිස්සේ කටයුතු කර නොතිබුණි.

### 1.3.3 සාක්ෂි නොමැතිකම

විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.1,093,190 ක් සඳහා වූ එක් ගනුදෙනුවක් විගණනයේදී සතුටුදායක අන්දමින් සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

### 1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත 44(2) වගන්තිය | සභාවට අයත් මාර්ග හා පටු මාර්ග පිළිබඳ උපලේඛණ රජයේ ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.26,332.911 ක් වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම සමඟ සැසඳුවිට, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අනුරූපී සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,567,828 ක් විය. ආදායමේ වැඩිවීම හේතුකොට ගෙන මූල්‍ය ප්‍රතිඵලය රු.6,234,917 කින් වර්ධනය වීමට හේතු විය.

### 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනය රු.81,331,375 ක් වූ අතර අනුරූපී ඉකුත් වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනය රු.49,294,915 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු.32,036,820 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.3 ආදායම් කළමනාකරණය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කළ පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තත්‍ය | රු'000 |
| | රු'000 | රු'000 | |
| වරිපනම් හා බදු | 6,683 | 6,996 | 9,562 |
| බදු කුලී | 19,535 | 29,843 | 306 |
| බලපත්‍ර ගාස්තු | 791 | 637 | - |
| වෙනත් ආදායම් | 56,712 | 58,819 | 50,627 |
| | 83,721 | 96,295 | 60,495 |

**2.3.2 වරිපනම් හා බදු**

රු.9,561,530 ක් වූ හිඟ වරිපනම් හා බදු සමාලෝචිත වර්ෂය තුලදී අයකර නොතිබුණි.

**2.3.3 කුලී**

රු.306,275 ක් වූ කුලී සමාලෝචිත වර්ෂය තුලදී සභාව විසින් අයකර නොතිබුණි.

**2.3.4 බලපත්‍ර ගාස්තු**

රු.90,900 ක් වූ බලපත්‍ර ගාස්තු සමාලෝචිත වර්ෂය තුලදී සභාව විසින් අයකර නොතිබුණි.

**2.3.5 මුද්දර ගාස්තු**

වටිනාකම රු.47,948,181 ක් වූ මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් සමාලෝචිත වර්ෂය තුලදී අයකර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**අක්‍රීය වත්කම්**

(අ) වටිනාකම රු.3,000,000 ක් වූ වාවකච්චේරි මාලු වෙළෙඳපොල භාවිතයෙන් තොරව වසරක කාලයක් අක්‍රීයව පැවතුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරියේ රු.1,079,378 ක් වූ තැන්පතු අපේක්ෂිත කටයුත්ත සඳහා උපයෝගී කරගෙන නොතිබුණි.

## 3.2 සණ අපද්‍රව්‍ය කළමනාකරණය

සභාවේ කාර්යය පථයක් වූ සණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

අයවැය විධිමත්ව පිළියෙල කර නොතිබුණි. එනිසා අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර රු.119 සිට රු.2,336,406 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කටයුතු සතුටුදායක අන්දමින් සිදුකර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) වාහන ධාවන සටහන්

(ආ) අතිකාල වවුචර්